# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

**ඩී. ජී. ජේ. කේ. ජයවර්ධන**

අංක. 11/25,

සමගි පුර,

කිරිමැටිතැන්න,

බලංගොඩ

<u>අභියාචක</u>

**අභියාචනා අංකය : 655/2021**

එදිරිව

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**- සබරගමුව පළාත**
පළාත් සභා සංකීර්ණය,
රත්නපුර

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී ය. :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

**අභියාචක -** ඩී. ජී. ජේ. කේ. ජයවර්ධන

**පොදු අධිකාරිය -** පොදු අධිකාරිය වෙනුවෙන් සමින්ද දයාරත්න මහතා, කළමනාකරණ සේවා නිලධාරී පෙනී සිටි.

**ලිඛිත සැළකිරීම් :**

**අභියාචක -** ඉදිරිපත් කර නොමැත.

**පොදු අධිකාරිය -** ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය :** 2022.02.07

**තීරණය කළ දිනය :** 2022.02.07

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2020.09.28 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

*01. " RTI - 04 - ලියාපදිංචි අංක - RTI/APL/08 - 2020/08/25 දිනැති ලිපියට අනුව, 2020/09/10 - A/4-No.768924 යටතේ, ඔබ විසින් සඳහන් කරන ලද මුදල ගෙවූ පසු සහතික කල පිටපත් ලබාදුන් ගොනුව (PPSC/S/05/F1/02/39) නිරීක්ෂණය කිරීමට.*

*02. පළාත් පාලන කොමසාරිස්ගේ අංක-CLG 2/1/5 හා 2017/11/13 දිනැති ලිපියේ සඳහන් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLG01 හා 2017/11/13 දිනැති ලිපියෙන් නිරීක්ෂණය කරන ලද කරුණු - ඇමුණුම-01 නිරීක්ෂණයට හා ඡායාපිටපත් දෙකක් (සහතික කරන ලද) ලබාගැනීමට.*

*03. 2017/11/24 දින රැස්වීමට සහභාගී වූ සාමාජික පැමිණීමේ ලේඛනය නිරීක්ෂණය කිරීමට.*

*04. 2017/11/24 දින පවත්වන ලද සම්පූර්ණ රැස්වීම් වාර්තාව (විධිමත් පරිදි) නිරීක්ෂණයට හා විධිමත් පරිදි එම වාර්තාවේ සහතික කල පිටපත් දෙකක් ලබාගැනීමට.*

*05. 2017 වර්ෂයේ නොවැම්බර් මස 24 දින වන විට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ලැයිස්තුව (සංයුතිය) නිරීක්ෂණය කිරීමට.*

*06. 2017/11/24 දින පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ පැමිණීම සඳහන් පැමිණීමේ ලේඛනයේ අදාල පිටුව නිරීක්ෂණය කිරීමට හා එදින බැහැරයාමේ ලේඛනයේ අදාල පිටුව නිරීක්ෂණය කිරීමට*

*07. 2017/11/24 දින පවත්වන ලද රැස්වීමේ සම්පූර්ණ වාර්තාවක් ලබාදිය නොහැක්කේ (විධිමත් පරිදි) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිලිබඳ පනතේ කුමන ව්‍යතිරේඛයක් යටතේද යන්න සඳහන් කරන්න."*

තොරතුරු නිලධාරියා විසින් පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දක්වා නොමැති අතර අභියාචකගේ තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් නම්කළ නිලධාරියා විසින් 2020.10.06 දිනැතිව පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

*01. "ඔබ විසින් මීට ප්‍රථමව තොරතුරු නිලධාරීගෙන් අවස්ථා තුනක (03) දී ද (2017.12.12/ 2019.12.19/2020.06.15 දින වල දී) නම් කළ නිලධාරි මගින් මෙවර ද ඇතුළුව අවස්ථා හතර ක දී ද (04) (2020.01.06/2020.07.09/2020.08.12/2020.09.30) මෙ සම්බන්ධව ඉල්ලීම් කර තිබේ. ඒ සෑම අවස්ථාවක දී ම එකම කරුණ නැවත නැවතත් ඉල්ලීම් කර ඇත. එබැවින් මීට පෙර ලබා දී ඇති තොරතුරු ඔබ වෙත ලබා නොදෙන අතර මීට පෙර ඉල්ලීම් කර නොමැති තොරතුරු ලිපි වල පිටපත් 02 මේ සමග අමුණා ඇත.*

*02. තවද මින් ප්‍රථම ඔබේ ඉල්ලීම් අනුව කොමිෂන් සභා වාර්තාවේ සහතික කළ පිටපත් හා එදින කොමිෂන් සභාවේ පැමිණීමේ ලේඛනයේ පිටපත් ද ලබා දී ඇත. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යනු පුළුල් ක්ෂේත්‍රයක් ඔස්සේ තීරණ ගන්නා ආයතනයකි.තව ද කොමිෂන් සභා වාර්තාවක් තුල ඔබගේ තීරණයට අදාල කරුණු පමණක් නොව වෙනත් විවිධ වූ කරුණු බොහොමයක් එහි අඩංගු වේ. ඔබගේ කරුණට අදාල කොමිෂන් සභා වාර්තාවේ අඩංගු තීරණය මීට ප්‍රථමව කිහිප විටකදී ලබා දී ඇති බැවින් හා ඔබගේ තීරණය සඳහා අනෙකුත් කරුණු බලනොපාන බැවිනුත්, එම කරුණු වෙනත් පුද්ගලයන්ට අයිති පෞද්ගලික තොරතුරු බැවින් හා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන විභාග ආදියේ කරුණු බැවින් කොමිෂන් සභා වාර්තාව සම්පූර්ණයෙන් ලබා දීම ප්‍රතික්ෂේප කරමි.*

*03. තව ද කාර්ය මණ්ඩලයේ පැමිණීමේ ලේඛනය මෙම කරුණ හා කිසිසේත්ම සම්බන්ධයක් නොමැති බැවින් එය ද ලබා දීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් කෙසේ වුවත් ඔබට තොරතුරු ලබා දුන් ගොනුව නිරීක්ෂණය කල හැකි අතර එහි වෙනත් පුද්ගලයන්ට අදාල කරුණුත් අඩංගු බැවින් ඔබට අදාල ලිපි පමණක් නිරීක්ෂණය කල හැකි බව දන්වා සිටිමි.”*

තොරතුරු නිලධාරියා විසින් පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2020.12.22 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදී.

නම්කළ නිලධාරියා විසින් 2020.12.30 දිනැතිව ලබාදුන් පහත පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2021.01.07 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදී.

*“.....................02. ඔබ වෙත 2020.10.06 දාතමින් පිළිතුරු ලිපියක් එවා ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත.*

*03.තව ද මෙම අවස්ථාව ද ඇතුළුව ඔබ විසින් මීට ප්‍රථමව තොරතුරු නිලධාරීගෙන් හා නම්කළ නිලධාරිගෙන් අවස්ථා 08 කදී ඉල්ලීම් සිදු කොට ඇත. ඒ සෑම අවස්ථාවක දීම එකම තොරතුරු නව නැවතත් ඔබ විසින් ඉල්ලා ඇත. ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු පැහැදිලිව ඔබ වෙත කිහිප විටක දී ලබා දී ඇත.*

*04.කෙසේ වුවත් ඔබට තොරතුරු ලබා දුන් ගොනුව නිරීක්ෂණය කල හැකි අතර එහි වෙනත් පුද්ගලයන්ට අදාල කරුණුත් අඩංගු බැවින් ඔබට අදාල ලිපි පමණක් නිරීක්ෂණය කල හැකි බව දන්වා සිටිමි.”*

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2020.09.28 දිනැති තොරතුරු ඉල්ලීමේ අඩංගු අංක 01,02 සහ 03 යටතේ තොරතුරු දැනටමත් ලබා දී ඇති බවට අභියාචක පිළිගනී.

තොරතුරු ඉල්ලීමේ අයිතම අංක **04,05** සහ **06** යටතේ ඉල්ලා ඇති තොරතුරු අභියාචක විසින් ඉල්ලා ඇති ආකාරයෙන් එම තොරතුරු මුදා හැරිය හැකි බවට පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටින නිළධාරී මහතා පිළිගනී.

**04** වන අයිතමය යටතේ ඉල්ලා ඇති තොරතුරු නිසි පරිදි ලබා දෙන්නේ නම්**, 07** වන අයිතමය යටතේ ඉල්ලා ඇති තොරතුර ලබාදීම අවශ්‍ය නොකෙරේ.

ඒ අනුව මෙම අභියාචනා විභාගය අවසන් කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

මෙම අභියාචනා තීරණයේ පිටපත් පොදු අධිකාරිය, තොරතුරු නිළධාරී, අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

***අභියාචනය අවසන් කරන ලදී.***

****